ශීර්ෂය 013- මානව හිමිකම් කොමිෂන් සභාව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 013 - මානව හිමිකම් කොමිෂන් සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය,එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මානව හිමිකම් කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ප්‍රධාන ගණන් දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව මානව හිමිතම් කොමිෂන් සභාවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජුනි 13 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත්කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මානව හිමිකම් කොමිෂන් සභාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව මානව හිමිකම් කොමිෂන් සභාවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස්කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව මානව හිමිකම් කොමිෂන් සභාවේ මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියළුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව මානව හිමිකම් කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්,වියදම්,වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව මානව හිමිකම් කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර,එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හදුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්,ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) සමාලෝචිත වර්ෂයේ මිලදීගෙන තිබූ මූල්‍ය නොවන වත්කම්, මූල්‍ය ප්‍රකාශන අනුව රු.14,905,920 ක් වුවද ස්ථාවර වත්කම් ලේඛනය අනුව එම වටිනාකම රු.13,349,113 ක් වූයෙන් රු.1,556,807 ක වෙනසක් නිරීක්ෂණය විය.	නිරීක්ෂණය පිළිගෙන ඇති අතර මෙම වෙනසට හේතුව වන්නේ ප්‍රාදේශීය කාර්යාල වල මිලදී ගැනීම් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබීම සහ මිලදී ගත් භාණ්ඩ කිහිපයක් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් නොකිරීම වන අතර එය නිවැරදි කිරීමට කටයුතු කරන බව දක්වා ඇත.	ස්ථාවර වත්කම් ලේඛනය යවත්කාලීනව පවත්වා ගත යුතුය.
(ආ) 2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව භාණ්ඩ අයිතම 83 ක් අපහරණය කර තිබුණද එම භාණ්ඩවල පිරිවැය හඳුනාගෙන මූල්‍ය නොවන වත්කම්වලින් ඉවත්කිරීමට කටයුතු කර නොතිබුණි.	මෙම භාණ්ඩවල පිරිවැය හඳුනා ගැනීම අසීරුවීම හා එම අයිතම CIGAS මඟින් හඳුනා ගැනීම අපහසු බැවින් එය මූල්‍ය වත්කම් තුළින් ඉවත් කිරීම සිදුවී නැති බවත් එය නිවැරදි කිරීමට කටයුතු කරන බවත් දන්වා ඇත.	අපහරණය කරන ලද වත්කම් වල පිරිවැය මූල්‍ය නොවන වත්කම් වලින් ඉවත් කල යුතුය.
(ඇ) සමාලෝචිත වර්ෂය තුල විගණනයට ඉදිරිපත් කරන ලද වාහන පිළිබඳ තොරතුරු අනුව හා BOS Report එක අනුව යතුරුපැදි 02 ක පිරිවැය හෝ තක්සේරු අගය ගිණුම්ගත කර නොතිබුණි.	ඉදිරියේදී යතුරුපැදි දෙක නැවත තක්සේරු කර CIGAS පරිගණක පද්ධතියට ඇතුළත් කරන බව සඳහන් කර ඇත.	සියලුම වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය.
(ඈ) 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති අංක 06/2024 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 8.2 ඡේදය අනුව 2004 වර්ෂයට පෙර වත්කම්, තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දක්වා ඇත.	ගිණුම් මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කල යුතුය.

(ඉ) වටිනාකම රු.701,786 ක් වූ පුස්තකාල පොත් මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා තිබුණද වසර ගණනාවක සිට මෙම පුස්තකාල පොත් වාර්ෂිකව භාණ්ඩ සමීක්ෂණය සඳහා යොදාගෙන නොතිබුණි.	නිරීක්ෂණය පිළිගෙන ඇති අතර පුස්තකාල පොත් සංගණන කටයුතු 2025 වසරේ සිදු කිරීමටත් ඒ අනුව ඉදිරියේදී භාණ්ඩ සමීක්ෂණයට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දක්වා ඇත.	පුස්තකාල පොත් භාණ්ඩ සමීක්ෂණය සඳහා අදාල කර ගත යුතුය.

1.6.2 අග්‍රිම ශේෂය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
ACA3 ආකෘතියේ අග්‍රිම පියවීම් ලෙස රු.375,167,059 ක් දක්වා තිබුණද ඒකාබද්ධ ශේෂ පිරික්සුමේ එම වටිනාකම රු.380,489,153 ක් වූයෙන් රු.5,322,094 ක වෙනසක් නිරීක්ෂණය විය.	දෙපාර්තමේන්තු ඒකාබද්ධ ශේෂ පිරික්සුමට අනුව වියදම මගින් අග්‍රිම පියවීම රු.375,167,059ක් වන අතර, මුදල් මගින් අග්‍රිම පියවීම රු. 5,322,094 ක්ද එකතුව රු. 380,489,153 ක්ද බව දක්වා ඇත.	මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය.

1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
ව්‍යාපෘතිවල වියදම් දැරීම සඳහා නඩත්තු කර තිබූ තත්ත්කාර්ය අත්තිකාරම් ලේඛනය නිසි පරිදි යාවත්කාලීන කර නොතිබුණි.	නිරීක්ෂණය පිළිගෙන ඇති අතර එය නිවැරදි කිරීමට කටයුතු කරන බව දක්වා ඇත.	අත්තිකාරම් ලේඛනය නිසි ලෙස යාවත්කාලීනව පවත්වා ගත යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 අග්‍රිම කළමනා කරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මු.රෙ. 371(05) ට අනුකූල නොවන ලෙස අතුරු අග්‍රිමය නැවත පියවිය යුතු කාලය ඉක්මවා දින 11 සිට දින 170 කාලපරාසයක් ගෙනතිබූ අවස්ථා 74 ක් විය.	නිරීක්ෂණය පිළිගෙන ඇති අතර නැවත එවැනි ප්‍රමාදයන් සිදු නොවන ලෙස කටයුතු කිරීමට අදාල නිලධාරීන් හා අංශ දැනුවත් කර ඇති බව දක්වා ඇත.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ) මු.රෙ.371(2)(ආ) අනුව කිසියම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරින්ට පමණක් එක් අවස්ථාවක දී රු.100,000 ක උපරිමයක් දක්වා තත්කාර්ය අතුරු අග්‍රිමයක් ලබා දීමට ගණන් දීමේ නිලධාරියාට හැකි වුවද එම සීමාව ඉක්මවා අවස්ථා අතුරු අග්‍රිම එකක් ලබා දී තිබූ බව නිරීක්ෂණය විය.	නිරීක්ෂණය පිළිගෙන ඇති අතර ඉදිරියේදී එය නැවත සිදු නොවීමට සටහන් කරගත් බව දක්වා ඇත.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.

3.2 වියදම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
රජයේ මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු නිසි පරිදි පිළියෙළ කර නොමැති වීම හේතුවෙන් පුනරාවර්තන වැය විෂයයන් 14 ක හා ප්‍රාග්ධන වැය විෂයයන් 02 ක ඉතිරිවීම් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 13 සිට සියයට 73 දක්වා පරාසයක පැවතුණි.	මෙහි සඳහන් 1502 හා 1505 වැය විෂයයන්හි වියදම් අපේක්ෂා කළ පරිදි සිදු නොවීම සහ ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වියදම් පාලනය නිසා අනෙකුත් වැය විෂයයන්හි වියදම් සීමා වූ බව දක්වා ඇත.	මු.රෙ.50 ප්‍රකාරව සකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය පිළිබඳ නිසි සැලකිල්ලෙන් යුතුව වියදම් ඇස්තමේන්තු පිළියෙල කල යුතුය.

3.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) 2025 වර්ෂයේ ගෙවීම් කර තිබුණු සමාලෝචිත වර්ෂයට අදාල එකතුව රු.3,107,679ක් වූ වියදම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල බැරකම්වලට එළඹෙන ලද බැඳීම් ප්‍රකාශනයේ (ඇමුණුම iv) දක්වා නොතිබුණි.	2025 ජනවාරි 31 දිනට පෙර බැඳීම් හා බැරකම් CIGAS වෙබ් පද්ධතිය වෙත ඇතුළත් කළයුතු බැවින් ඒ අනුව ජනවාරි 25 දින වන විට තිබුණු බැරකම් පමණක් CIGAS පද්ධතියට ඇතුළත් කර බව සඳහන් කරයි.	සමාලෝචිත වර්ෂයට අදාල සියලු බැරකම් මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් කල යුතුය.
(ආ) 2025 ජනවාරි 01 දින සිට 2025 මාර්තු 31 දින දක්වා ඉදිරියට ගෙවූ ගොඩනැගිලි කුලී රු.255,000 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල බැරකම් පිළිබඳ ප්‍රකාශයට ඇතුළත් කර තිබුණි.	නිරීක්ෂණ පිළිගෙන ඇත.	වර්ෂයට අදාල බැරකම් පමණක් ඇතුලත් කල යුතුය.

3.4 නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති, රීති හා රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම	ප්‍රධාන ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 වගන්තිය	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව 2024 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාව සතු වාහන 39 සඳහා ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි.	උක්ත චක්‍රලේඛයේ විධිවිධාන පරිදි ඉදිරියට ඉන්ධන දහන පරීක්ෂාවන් සිදුකිරීමට කටයුතු කරනු ලැබේ.	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ) 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 ඡේදය	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	මිලදී ගන්නා සහ අපහරණය කරන වත්කම් පිළිබඳ තොරතුරු ඉහත පරිදි කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත යොමු කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 සැලසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂනයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව 2024 වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර අනුමැතිය ලබා නොතිබුණි.	නිවැරදි ආකෘතියෙන් යුක්තව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව සඳහන් කර ඇත.	අදාල චක්‍රලේඛය හා අදාල අකෘතිය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර අනුමැතිය ලබා ගත යුතුය.
(ආ)	කොමිෂන් සභාව වෙත ලද පැමිණිලි හා ඒවා විසඳීම		
(i)	2024 ජනවාරි 01 දිනට විසඳීම සඳහා වූ පැමිණිලි 8,778 ක්ද සමාලෝචිත වර්ෂය තුලදී ලද පැමිණිලි සංඛ්‍යාව 9,844 ක්ද වූයෙන් විසඳීම සඳහා වූ පැමිණිලිවල එකතුව 18,622 ක්ද විය. වර්ෂය තුලදී ඉන් පැමිණිලි 8,135 ක් එනම් මුළු පැමිණිලි සංඛ්‍යාවෙන් සියයට 44 ක් අවසන් කර තිබුණි. එසේ අවසන් කරන ලද පැමිණිලි 8,135 න්,පැමිණිලි 1,599 ක් මූලික අයිතිවාසිකම් කඩනොවීම මතද, පැමිණිලි 2,458 ක් පැමිණිල්ලේ උනන්දුවක් නොමැති වීම මතද පැමිණිලි 927 ක් විෂයය පථයට අයත් නොවීම මතද ලෙස පැමිණිලි 4,984 ක් අවසන් කර තිබුණි.	ආයතනයේ පැවති සේවක හිඟය සහ පැමිණිලි විභාග කිරීමේ කටයුතුවලට අමතරව අනෙකුත් අතිරේඛ රාජකාරි කටයුතු නිලධාරීන් විසින් ඉටුකරනු ලබන බැවින් 2024.12.31 දිනට පැමිණිලි 8572ක් ඉතිරිවී ඇති බව දන්වා ඇත.	පැමිණිලි කඩිනමින් විසඳීම සඳහා නව ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු වේ.
(ii)	2024 වර්ෂය තුලදී පැමිණිලි 352ක් සමථයට පත්කර තිබූ අතර පැමිණිලි 897ක් සහන ලැබීම මත අවසන් කර තිබුණි. වර්ෂය තුළදී නිර්දේශ 55ක් ලබා දී තිබූ අතර එම පැමිණිලි ලද වර්ෂ අනුව විසඳීමට ගත කල කාලය පැමිණිල්ල ලැබී වර්ෂයක් තුල	1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත සම්බන්ධව මූලිකවම කළයුත්තේ සමථ කිරීම වන අතර, අවසාන කටයුත්ත ලෙස සිදු කරනුයේ විමර්ශනය හා නිර්දේශ ලබා දීමයි. එමෙන්ම පැමිණිලි විභාග	පැමිණිලි කඩිනමින් විසඳීම සඳහා නව ක්‍රමවේදයක් අනුගමනය කිරීම පිළිබඳ අවධානය යොමුකළ යුතු වේ.

	පැමිණිලි 11 ක්ද, වර්ෂ 02 ත් 04 ත් අතර කාලය තුල පැමිණිලි 22 ක් ද,වර්ෂ 06 ත් 08 ත් අතරකාලය තුල පැමිණිලි 09 ක් ද, වර්ෂ 08 ක් තුල පැමිණිලි 03 ක් ද, වර්ෂ 10 ට වැඩි එක් පැමිණිල්ලක්ද විය. තවද නිර්දේශ ලබා දී තිබූ පැමිණිලි 55 න් නිර්දේශ 05 ක් පමණක් ක්‍රියාත්මක කර තිබූ අතර නිර්දේශ 02 ක්පැමිණිලිකරුවන් ඉවත් කරගෙන තිබුණි.	කිරීමෙන් අනතුරුව මූලික අයිතිවාසිකම් කඩවීමක් තහවුරු නොවන අවස්ථාවලදී එවැනි පැමිණිලි සම්බන්ධයෙන් නිර්දේශ ලබාදීමක් සිදු කරනු නොලබයි. මූලික අයිතිවාසිකම් කඩවීමක් සිදුවී ඇති බවට සාක්ෂි මත කරුණු තහවුරු වී ඇති පැමිණිලි 55 ක් සඳහා පමණක් නිර්දේශ ලබාදී ඇති බව දන්වා ඇත.	
(iii)	වර්ෂ 2001 සිට වර්ෂ 2024 අතර කාලය තුල ලද පැමිණිලි විභාග කර ලබාදුන් නිර්දේශ 68 ක් පිළිබඳ කොමිෂන් සභාව සිදුකල පසු විපරම් පරීක්ෂාව අනුව නිර්දේශ ලබාදී වසර 20 ක කාලය තුල ක්‍රියාත්මක කිරීමට හෝ එකඟතාවය ලබා ගැනීමට හැකිවී තිබූයේ නිර්දේශ 12 ක් සඳහා පමණි. එය පසු විපරම් කළ මුළු නිර්දේශ සංඛ්‍යාවෙන් සියයට 17 ක් විය. නිර්දේශ ක්‍රියාත්මක නොවීම පිළිබඳව, පනත අනුව අවසානාත්මක කාර්යය ජනාධිපතිවරයාට වාර්තා කිරීම වුවද නිර්දේශ 04 ක් සඳහා පමණක් ජනාධිපතිවරයා වෙත වාර්තා කර තිබුණි.	නිර්දේශ ක්‍රියාත්මක කිරීමට වගඋත්තරකරුවන් කටයුතු නොකිරීම පිළිබද පසු විපරම් කිරීම සිදු කරයි. නමුත් කොමිෂන් සභාව එසේ පසු විපරම් සිදු කර නිර්දේශ ක්‍රියාත්මක නොකර හැරීම සම්බන්ධයෙන් ජනාධිපතිතුමා වෙත වාර්තා කිරීම පනත අනුව සිදුකරනු ලබයි.	නිර්දේශ ක්‍රියාත්මක කරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග පිළිබඳ අවධානය යොමුකල යුතුය.
(iv)	පරිගණක දත්ත පද්ධතියට ආරම්භක දත්තයන් ඇතුලත් කර නොතිබීමෙන් හා දත්ත පද්ධතිය එදිනෙදා යාවත්කාලීනව පවත්වාගෙන නොයාම හේතුවෙන් පරිගණක දත්ත පද්ධතිය අනුව සමාලෝචිත වර්ෂය තුල ලබා දුන් නිර්දේශ සංඛ්‍යාව 38 ක් වුවද පවත්වා තිබූ ලේඛන අනුව එම සංඛ්‍යාව 55 ක් විය.	2024 ට අදාළ පැමිණිලි ගොනු වලට අමතරව දත්ත පද්ධතිය යාවත්කාලින කර නිවැරදි කරන බවත් 2024 වසරේදී ලබාදි ඇති නිර්දේශ 55 අතරින් දත්ත පද්ධතියට නිර්දේශ 38ක් පමණක් ඇතුලත්වී තිබුනේ ගොනු 17ක් දත්ත පද්ධතියට ඇතුලත් නොවීම නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගනිමින් සිටින බවත් දක්වා ඇත.	පරිගණක පද්ධතිය යාවත්කාලීනව පවත්වා ගෙන යා යුතු වේ.

(v)	2024 වර්ෂය තුලදී දිස්ත්‍රික් කාර්යාල හා උපකාර්යාලවල පැමිණිලි විසඳීම අනුව, යොදවා ඇති නිලධාරීන් සංඛ්‍යාව සහ ලැබෙන පැමිණිලි සංඛ්‍යාව අනුව මසකට එක් නිලධාරියෙකුට පැමිණිලි 02 සිට 16 දක්වා පරාසයක පැමිණිලි සංඛ්‍යාවක් ලැබී තිබූ අතර දිස්ත්‍රික් කාර්යාලවල සමාලෝචිත වර්ෂය අවසානයේ පැමිණිලි 2351 ක් නොවිසඳී තිබුණි. ඒ අනුව පැමිණිලි විසඳීමේ ක්‍රමවේදය දිස්ත්‍රික්ක මට්ටමින් පසුවිපරම් කර කාර්යක්ෂමතාවය වැඩිකර ගැනීම කෙරෙහි අවධානය යොමුකළ යුතු බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.	මේ පිළිබඳව කොමිෂන් සභාවේ අවධානය යොමු කර ඉදිරියේදි කොමසාරිස්වරයෙකුගෙන් යුත් ප්‍රධාන කාර්යාලයේ නිලධාරින් කණ්ඩායමක් ප්‍රාදේශිය කාර්යාල වෙත ගොස් පැමිණිලි ගොනු අධික්ෂණය කර ඒවා කඩිනමින් අවසන් කිරිමට අවශ්‍ය උපදෙස් ලබාදිමට තිරණය කර ඇති බව දක්වා ඇත.	දිස්ත්‍රික් කාර්යාල වල කටයුතු නිසිලෙස අධීක්ෂණය කල යුතු වේ.

4.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2017 ජූලි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය අනුව වත්කම් CIGAS පද්ධතිය මඟින් ගිණුම්ගත කර ඇතත් එම චක්‍රලේඛයේ 09 ඡේදය ප්‍රකාරව වත්කම් හඳුනාගැනීම හා කළමනාකරණය යන කටයුතු වලදී මෙම වර්ගීකරණ කේතයන් භාවිතා කිරීම සිදුකලයුතු වුවත් එසේ නොකිරීම හේතුවෙන් භාණ්ඩ සමීක්ෂණයේදී වත්කම් නිශ්චිතවම හඳුනාගත නොහැකි විය.	පෙර වර්ෂවල සිට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකරන ලද පරිදි පැරණි කේත ක්‍රමය හා භාණ්ඩ වර්ග කිරීම අනුව මෙම වර්ෂයේදීත් භාණ්ඩ සමීක්ෂණය සිදුකල අතර, ඉදිරියේදී නව කේත ක්‍රමය යටතේ වත්කම් අංකනය සිගාස් පැකේජයේ කේතයන් යටතේ සිදුකරන බවත් සඳහන් කර ඇත.	අදාල චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය.
(ආ)	කොමිෂන් සභාව විසින් වාහන ලේඛනයක් පවත්වා නොතිබූ අතර 2024 වර්ෂයට අදාලව වාහන 21ක ධාවනය කළ දුර පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය.	කොමිෂන් සභාව සතුව වාහන ලේඛනය මේ වනවිට අස්ථානගත වී ඇති බැවින් නැවත එම ලේඛනය විධිමත් ආකෘතියට අනුව සකස් කර ඉදිරිපත් කරන බව දක්වා ඇත.	වාහන ලේඛනය යාවත්කාලීන කර සකස් කල යුතුය.

(ඇ) මු.රෙ. 756(6) ප්‍රකාරව සමාලෝචිත මුදල් වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ කටයුතු 2025 මාර්තු 15 දිනට පෙර අවසන් කළ යුතු වුවද යාපනය කාර්යාලයේ පමණක් භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර තිබුණි.	ප්‍රාදේශීය කාර්යාල 10ක් සහ උප කාර්යාල 05 කින් සමන්විත ආයතනයක් බැවින් එම කාර්යාලවල භාණ්ඩ සමීක්ෂණය ඉදිරියේදී කඩිනමින් සිදු කර ජුලි 15 ට පෙර වාර්තාවන් ගණන් දීමේ නිලධාරියාට සහ විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දක්වා ඇත.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය.
(ඈ) 2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය අනුව 2025 අප්‍රේල් 30 දින වන විටද ප්‍රධාන කාර්යාලය සහ ශාඛා කාර්යාල 05 ක භාණ්ඩ අපහරණ කටයුතු සිදුකර නොතිබුණි.	මෙම වර්ෂයේදී එම අපහරණය කල යුතු භාණ්ඩ වෙනත් ආයතනයක් වෙත ලබාදීමට හෝ විකිණීමට හෝ විනාශ කිරීමට කටයුතු සිදුකරන බව දන්වා ඇත.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය.

5. යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණකවරයෙකු පාලක මණ්ඩලයේ අනුමැතිය ඇතිව 2023 නොවැම්බර් 01 වන දින පත්කර තිබුණද විගණිත දින වන තෙක් කිසිදු අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.	බඳවාගැනීම් සීමා කර තිබූ බැවින් අභ්‍යන්තර විගණකගේ සහය සඳහා නිලධාරීන් පත්කිරීම පමා වී ඇති අතර මෙම වර්ෂය තුළදී කළමනාකරණ සහකාරවරුන් බඳවාගත් පසු ඉදිරියේදී අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු කාර්යක්ෂමව සිදු කිරීමට පියවර ගනු ලැබේ.	ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතුය.

5.2 විගණන හා කළමනාකරණ කමිටුව

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තිය යටතේ සෑම අස්ථිත්වයක් විසින්ම විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතු වුවද 2017 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා විගණන හා කළමනාකරණ කමිටු එකක් පමණක් පවත්වා තිබුණි.	අභ්‍යන්තර විගණන අංශයට අවශ්‍ය නිලධාරීන් බඳවාගත් පසු විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීම නිසියාකාරව සිදු කිරීමට සැලසුම් කර ඇති බව දක්වයි.	ජාතික විගණන පනතේ 41 වගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතුය.

6. මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 221 ක් වන අතර තත්‍ය කාර්ය මණ්ඩලය 160 ක් වූයෙන් තනතුරු 61 ක් පුරප්පාඩු වී තිබිණි. එම පුරප්පාඩු වලින් තනතුරු 05 ක් රාජකාරී ඉටු කිරීමේ පදනම මතද, තනතුරු 14 ක් කොන්ත්‍රාත් පදනම මඟින්ද, එක් තනතුරක් දෛනික පදනම මඟින්ද සපුරාගෙන තිබුණි.	එක් නිලධාරියෙකු ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොනු කර තිබීම, පුරප්පාඩු පිරවීම රජය මඟින් අත්හිටුවීම සහ අයදුම්පත් කැඳවන ලද නමුත් නියමිත සුදුසුකම් සපුරා නොතිබීම මත බඳවා ගැනීමට නොහැකි විය. පර්යේෂණ සහකාර තනතුර සඳහා සංවර්ධන නිලධාරින් පත් කර ගන්නා ලෙස කැබිනට් අනුමැතිය ලබා දී ඇති අතර ඒ පිළිබඳව ඉදිරියේදී කටයුතු කරනු ලබන බව දන්වා ඇත.	අත්‍යවශ්‍ය තනතුරු වල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කල යුතුය.